# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,078 - 2018 ජුනි මස 29 වැනි සිකුරාදා - 2018.06.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 106 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | — |


*සැ. යු.*- (i) අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය පනත් කෙටුම්පත 2018 ජුනි මස 14 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

(ii) සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත 2018 ජුනි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 ජූලි මස 20 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ජූලි මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

105- B 081425 - 353 (2018/06)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් පිහිලිඇලේ ගෙදර සුනිල් අබේකෝන් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.07.11 දින ප්‍රදානය කර ඇති අංක අනු/රාජා/ප්‍ර/835 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරු වන රාජාංගනය යාය 06 පදිංචි අධිකාරි මුදියන්සේගේ කුඩාබණ්ඩා නවරත්න මහත්මයා වෙත ප්‍රදානය කොට අනුරාධපුරය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 2822 යටතේ 1996.05.17 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උප ලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය 2018.07.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම්දිය යුතු ය.

### උපලේඛනය

උතුරු මැද පළාත අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එප්පාවල කෝරළේ 499 ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ තුඹුල්ලේගම යාය 06 නැමති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ ඔහු භාරයේ ඇති අංක 02 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ.ජ.සි.අ. 433 දරන පිඹුරෙහි අංක 178 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති, ප්‍රමාණයෙන් අක්කර 01 (එකයි), රූඩ් 03 (තුනයි), පර්චස් 39 (තිස් නවයයි) ක් ඇතැයි ගණන් බලා තිබෙන ගොඩ ඉඩම යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 179 පාර රක්ෂිතය, |
| *නැගෙනහිරට* | : | අංක 177 ගොඩ ඉඩම, |
| *දකුණට* | : | අංක 241 ඉඩම, |
| *බස්නාහිරට* | : | අංක 182 ඉඩම, |

පී. ජී. සුනිල් අබේකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
රාජාංගනය.

2018 මාර්තු මස 28 වැනි දින.

06-970/1

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ගෝමර මුදියන්සේලාගේ කපුරු බණ්ඩාගේ රංජිත් ප්‍රියදර්ශන වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1987.07.22 දින ප්‍රදානය කර ඇති අංක අනු/ප්‍ර/18624 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අබේසිංහපුර - 349 පදිංචි කොළඹ මෝදර පරන පටබැඳිගේ තෝමස් පෙරේරා වෙත ප්‍රදානය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 260 යටතේ 1995.02.03 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උප ලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම ඇති අයෙකු සිටියද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2018.07.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

### උපලේඛනය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පදවිය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, උතුරු හුරුළු පත්තුවේ/ කෝරළේ 31 බී ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ, අබේසිංහපුර - පදවිය සී යාය නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද අංක ටී. පී. පී. 20 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 5093 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර 01, රූඩ් 03, පර්චස් 03 ක් විශාලත්වය ඇත්තාවූද, පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය, ගොඩ ඉඩම :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 5086, 5084, 5094 |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 5108, 5094 |
| *දකුණට* | : | කැබලි අංක 5092, 5108 |
| *බස්නාහිරට* | : | කැබලි අංක 5086, 5087, 5092 |

ජී. එම්. කේ. ආර්. ප්‍රියදර්ශන,
ප්‍රාදේශීය ලේකම්,
පදවිය.

2018 මාර්තු මස 28 වැනි දින.

06-970/2

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

වයඹ පළාත් සභාවේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එන්. ඒ. ඒ. එස්. ප්‍රියංකර වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1993 වසරේ දී ප්‍රදානය කර ඇති අංක එල්.එස්/කු 344 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන රත්මලාන, ශ්‍රී ධර්මාධාර මාවත, 89/2 හි පදිංචි හිලේරියන් නිකුලස් ඔලිවර් ප්ලේසිඩස් ප්‍රනාන්දු වෙත ප්‍රදානය කොට කුරුණෑගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ඩී 249/3709/93 යටතේ 1993.10.15 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2018.07.16 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ, කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දේවමැදි හත් පත්තුවේ බලදොර කෝරළේ 1323 කහටගස්වැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කහටගස්වැව නමැති ගමේ පිහිටා ඇත්තා වූද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 1593 හි අංක අතිරේක අංක 4 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 69 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූද, ප්‍රමාණයෙන් අක්කර 14, රූඩ් 2, පර්චස් 20 ක් පමණ විශාලත්වයක් ඇත්තාවූද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම, වාමදේව වත්ත :-

*උතුරට* : බිම් කට්ටි අංක 40 සහ බිම් කට්ටි අංක 70
*නැගෙනහිරට* : බිම් කට්ටි අංක 70
*දකුණට* : බිම් කට්ටි අංක 70 සහ දංවිල ගම් මායිම
*බස්නාහිරට* : බිම් කට්ටි අංක 40.

එන්. ඒ. ඒ. එස්. ප්‍රියංකර,
ප්‍රාදේශීය ලේකම්,
කොබෙයිගනේ.

2018 මැයි මස 09 වැනි දින.

06-971